# ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතය

මත්ද්‍රව්‍ය වැරදි සඳහා 2009 වසරේදී අත්අඩංගුවට ගත් මුළු පුද්ගල සංඛ්‍යාව 18,743 කි. මෙම පුද්ගලයන්ගෙන් 68% ක් වයස අවුරුදු 30 හෝ ඊට වැඩි අය වූ අතර 30% ක් වයස අවුරුදු 20 ඉක්මවූ අය වූහ. අත්අඩංගුවට ගත් ගැහැණු පිරිමි අනුපාතය ගත්කල එය පිරිමි 29 කට ගැහැණු 1ක් ලෙස සටහන් වේ. 2009 වසරේ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගත් මුළු පුද්ගලයන් අතුරින් 29% ක් හෙරොයින් වැරදි සඳහාද 71% ක් ගංජා ආශ්‍රිත වැරදි සඳහාද අත්අඩංගුවට ගෙන තිබුණි. අත්අඩංගුවට ගත් පිරිසෙන් බහුතරයක් එනම් 48% ක් බස්නාහිර පළාතේ පදිංචිකරුවන් වූ අතර අනුපිළිවෙලින් වැඩිම ප්‍රතිශතයන් වාර්තා වන්නේ 13% ක් දකුණු පළාතින් හා 10% ක් මධ්‍යම පළාතිනි.

දිස්ත්‍රික්ක වශයෙන් ගත්කල ද කොළඹ දිස්ත්‍රික්කයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් වැඩි ප්‍රතිශතයක් අත්අඩංගුවට පත්වන අතර 2009 වසරේ එම සංඛ්‍යාව 34% කි. ගම්පහ දිස්ත්‍රික්කයෙන් 8% ක්ද මහනුවර දිස්ත්‍රික්කයෙන් 7% ක්ද අත්අඩංගුවට පත්වී තිබුණි. 2009 වර්ෂය තුළදී අත්අඩංගුවට ගැනීම්වල ව්‍යාප්තිය විමර්ශනය කරන කල්හි ජනගහනයෙන් ලක්ෂයක් ගත්කල මත්ද්‍රව්‍ය වැරදි සඳහා පුද්ගලයන් 93 දෙනෙක් අත්අඩංගුවට පත්වන අතර වයස අවුරුදු 14 ට වැඩි ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 125 දෙනෙක් අත්අඩංගුවට පත්වේ. 2009 වර්ෂයේදී අත්අඩංගුවට පත්වූ පුද්ගලයන්ගෙන් බහුතරය (81%) සිංහල ජාතිකයෝ වූහ.

**ගංජා**

විෂ මත්ද්‍රව්‍ය (නාකොටික් ගණයේ) අතුරින් ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන්නේ ගංජා ශාකය පමණි. ගංජා නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර සහ දකුණු පළාත්වල වගා කරනු ලබයි. මෙම ප්‍රදේශවල හෙක්ටයාර් 500 ක පමණ ගංජා වගා කෙරෙන බවට ඇස්තමේන්තු ගත කර ඇත. ගංජා වගාකිරීම සඳහා අඩු කම්කරු ශ්‍රමයක් අවශ්‍ය වන අතර නූතනයේ නවීන කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ භාවිත කරමින් ලංකාවේ ගංජා වගාකිරීම සිදුකරයි. වර්තමාන තරුණයන් අතර "ගංජා මල්" වඩා ජනප්‍රිය වී ඇත.

2009 වසරේ අත්අඩංගුවට ගත් පුද්ගලයන්ගෙන් බහුතරයක් (13,300) ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වී තිබුණි. මොවුන්ගෙන් බහුතරය කොළඹ දිස්ත්‍රික්කයෙන් (23%) අත්අඩංගුවට ගෙන තිබුණි. අනුපිළිවෙලින් ගම්පහ සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවලින් වැඩිපිරිසක් ගංජා සඳහා අත්අඩංගුවට පත්වී තිබුණි. 2009 වසරේදී සිදුකරනු ලැබූ ගංජා වැටලීම් පිළිබඳව සළකා බලනවිට පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය විසින් විශාල ගංජා ප්‍රමාණයක් වැටලූ අතර උතුරු කොළඹ පොලිස් කොට්ඨාශයෙන් සහ ශ්‍රී ලංකා රේගුවද වැඩි ගංජා ප්‍රමාණයක් වැටලීම් කර ඇත. ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල වගාකරන ගංජා කොළඹ සහ තදාසන්න නගරවලට ප්‍රවාහනය කර විශාල ලෙස මුදල් උපයනු ලබයි. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම් විමර්ශනය කරන කල්හි මෑතක සිට ගංජා සඳහා අත්අඩංගුවට ගැනීම් විශාල ලෙස වැඩිවෙමින් පවතින බව නිරීක්ෂණය කළ හැකිය.

දිවයින පුරා කළ වැටලීම්වලින් 2009 දී ගංජා කිලෝ 84,605 ක් අත්අඩංගුවට පත්වී ඇත. බස්නාහිර පළාතින් 38% ක් ගංජා අත්අඩංගුවට ගැනීම් 38% ක් වාර්තා වූ අතර පිළිවෙලින් දකුණ සහ මධ්‍යම පළාත්වලින් වැඩිවශයෙන් ගංජා වැටලීම් කර තිබුණි. 2008 වර්ෂය හා සසඳන විට 2009 දී ගංජා සඳහා අත්අඩංගුවට පත්වූවන්ගේ සංඛ්‍යාව 34% කින් පහත බැස ඇත. ගංජා සඳහා අත්අඩංගුවට ගැනීම්වල ව්‍යාප්තීන් සළකා බැලීමේදී ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 66 ක්ද, අවුරුදු 14 කට වැඩි ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 89 ක්ද ගංජා වැරදි සඳහා අත්අඩංගුවට පත්වේ.

ගංජා භාවිතය පිළිබඳ පසුගිය පස්වසරක දත්ත විශ්ලේෂණය කරන විට වර්තමාන ශ්‍රී ලංකා සමාජය තුළ ගංජා භාවිතය ප්‍රචලිතවීමේ ප්‍රවනතාවයක් දැකිය හැකි අතර එය සමාජ ප්‍රශ්නයක් බවට පත්වී ඇත. 2005-2007 කාලය තුළදී ගංජා සඳහා අත්අඩංගුවට ගැනීම් විශාල වශයෙන් වැඩිවී ඇත. 2005 දී අත්අඩංගුවට ගැනීම් 16,265 ක්ද 2006 දී 34,728 ක්ද විය. නමුත් 2008 සිට ගංජා සඳහා අත්අඩංගුවට ගැනීම් ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කරන අතර 2008 ට සාපේක්ෂව 2009 දී අත් අඩංගුවට ගැනීම් 34% කින් පහල යාමක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා ගංජා විෂහරණය කිරීමෙන් අනතුරුව යොදාගැනේ. අප රටේ ප්‍රධාන ගංජා පරිභෝජකයන් වන්නේ ආයුර්වේද ඖෂධ සංස්ථාව සහ ඖෂධ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරුන් පමණි. 2009 වසරේදී ආයුර්වේද නිෂ්පාදන සඳහා ගංජා කිලෝ 205 ක් ලබාගෙන තිබුණ අතර එයින් කිලෝ 191 ක් නාවින්න ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා යොදාගෙන ඇත.

**හෙරොයින්**

1980 ට පෙර ලංකාවේ හෙරොයින් භාවිතය සමාජ ප්‍රශ්නයක් නොවුන අතර එම කාලයේ විදේශිකයන් සහ විදේශගත වන ලාංකිකයන්, සංචාරක මඟපෙන්වන්නන් වැනි පුද්ගලයන් කිහිපදෙනෙක් හෙරොයින් භාවිත කළ බවට සාක්ෂි තිබුණි. 1980 දශකයේදී ශ්‍රී ලංකාව තුළ හෙරොයින් භාවිතය වඩාත් ප්‍රචලිතව පැවතියේ අගනුවර හා තදාසන්න ප්‍රදේශවල වුවද, වර්තමානය වනවිට එය නාගරික සහ ගම්බද ප්‍රදේශ කරා ව්‍යාප්ත වී ඇත.

නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් සාමාන්‍යයෙන් 10% ක් පමණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, භාවිතා කරන්නන් හා ප්‍රවාහකයින් අත්අඩංගුවට ගනු ඇතැයි විශ්වාස කෙරේ. වර්ෂ 2005 සිට 2009 කාලය තුළ අත්අඩංගුවට ගත් හෙරොයින් ප්‍රමාණයන් සළකා බලන කල්හි වීථි මට්ටමේ හෙරොයින් භාවිත කරන්නන් 45,000 ක් සඳහා දිනකට කිලෝ 2 ක් බැගින් වාර්ෂිකව හෙරොයින් කිලෝ 763 ක් පමණ පරිභෝජනය සඳහා අවශ්‍ය බව බව ඇස්තමේන්තු ගත කර ඇත. විශේෂයෙන් ඉන්දියාව සහ පාකිස්ථානයේ සිට ධීවර බෝට්ටු මගින් හෝ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් මුහුදින් හෝ ගුවනින් ශ්‍රී ලංකාව සමඟ හෙරොයින් ජාවාරම සිදුකරනු ලබයි. ලංකාවට ලැබෙන හෙරොයින්වලින් වැඩි කොටසක් ඉන්දියාවේ සිට බටහිර වෙරළ තීරයට මුහුදු මාර්ගයෙන් ප්‍රවාහනය කරන බවටද හෙළිදරව් වී තිබේ. 2009 වසරේ හෙරොයින්

ආශ්‍රිත වැරදි සඳහා 5,431 දෙනෙකු අත්අඩංගුවට පත්වූ අතර හෙරොයින් කිලෝ 34 ක් අත්අඩංගුවට ගෙන තිබුණි. අත්අඩංගුවට පත් පුද්ගලයන් බහුතරයක් හෙරොයින් සුළු ප්‍රමාණයක් තම පුද්ගල පරිභෝජනය සඳහා ළඟ තබාගැනීමේ වරදට හසුවූ අය වූහ. 2009 වසරේ හෙරොයින් අත්අඩංගුවට ගැනීම්වල ව්‍යාප්තිය සළකන කල්හි එය ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 27 ක් හා වයස අවුරුදු 14 කට වැඩි ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 36 දෙනෙකු ලෙස සටහන් වේ.

පසුගිය වසර 5 ක කාලය තුළ දත්ත විශ්ලේෂණය කරන විට හෙරොයින් ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම්වල හෝ හෙරොයින් භාවිත කරන සංඛ්‍යාවෙහි විශාල වෙනසක් සිදුවී නැති නමුදු ක්‍රමයෙන් අත්අඩංගුවට ගැනීම්වල පහත බැසීමක් පෙන්නුම් කරයි. 2005 වර්ෂයේදී හෙරොයින් වැරදි සඳහා අත්අඩංගුවට පත්වූ මුළු සංඛ්‍යාව 11,738 ක් වූ අතර එය 2009 දී 5,431 දක්වා 54% කින් පහත වැටී ඇත.

**අබිං භාවිතය**

ශ්‍රී ලංකාවේ අබිං සඳහා ඇබ්බැහිවූවන්ගේ සංඛ්‍යාවෙහි කිසිදු වර්ධනයක් දක්නට නොලැබෙන අතර 2009 වසරේදී අබිං ග්‍රෑම් 533 ක් හා පුද්ගලයන් 03 දෙනෙකු අත්අඩංගුවට පත්වී ඇත. මඩකලපුව, අනුරාධපුර සහ කොළඹ දිසත්‍රික්කවලින් මෙම පුද්ගලයන් අත්අඩංගුවට පත්වී තිබුණි.

අබිං ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ නිත්‍යානුකූල ලෙස භාවිත කරන්නේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා පමණි. සෞඛ්‍ය අමාත්‍යාංශය අබිං ආනයනය කර දිවයිනේ රෝහල් මගින් ආයුර්වේද රෝහල්වලට හා ආයුර්වේද වෛද්‍යවරුන්ට නිකුත් කරනු ලබයි. ශ්‍රී ලංකා රජය 2009 වසරේදී අබිං කිලෝ 124 ක් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිත කර තිබුණි.

**මත්ද්‍රව්‍ය වීථි මිළ ගණන්**

දේශීය ගැණුම්කරුවන් සඳහා හෙරොයින් කිලෝ එකක සාමාන්‍ය වීථි මිළ රුපියල් මිලියන 3.0 ක් ලෙස තීරණය වී තිබුණි. එය ඇමරිකානු ඩොලර් 26,086 කි. 2008 වසරට සාපේක්ෂව හෙරොයින් මිළ ගණන් 2009 වසරේදී 33% කින් පහත වැටී ඇති නමුදු පසුගිය වසර පහක කාලය හා සැසඳීමේදී 2005 දී සාමාන්‍ය වීථි මිල මිලියන 1.8 ක් වුවද 2009 දී එය මිලියන 3.2 දක්වා වර්ධනය වී ඇත.

දේශීය ගැණුම්කරුවන් සඳහා ගංජා කිලෝ එකක සාමාන්‍ය වීථි මිළ රුපියල් 12,200 ක් එනම් ඇමරිකානු ඩොලර් 104 ක් ලෙස සටහන් වී තිබුණි. ගංජා මිළ 2008 ට සාපේක්ෂව 2009 දී 40% කින් පහත වැටී තිබුණි. 2009 වර්ෂයේදී අබිං කිලෝ එකක සාමාන්‍ය වීථි මිළ රුපියල් මිලියන 0.9 ක් හෙවත් ඇමරිකානු ඩොලර් 7,826 ක් ලෙසට සටහන් වී තිබුණි.

## හෙරොයින්වල ශුද්ධතාවය

ශ්‍රී ලංකාවේ අලෙවිවන වීථි මට්ටමේ හෙරොයින්වල ශුද්ධතාවය නැතහොත් ඩයි ඇසිටයිල් මෝර්ෆින් (Di-acetyl morphine) ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය 2009 වසරේදී 40% කි. 2008 වර්ෂයට සාපේක්ෂව එම ශුද්ධතා අගය 2009 වසරේදී 10% කින් ඉහළ ගොස් තිබුණි. පිරිසිදු හෙරොයින්වලට ඩයසිෆෑම්(Diazepam), ලැක්ටෝස්(Lactose), සුක්රෝස්(Sucrose), ඇසිටමිනෝෆින්(Acetaminophen) සහ කැෆේන්(Caffeine) වැනි ද්‍රව්‍ය මිශ්‍රකරමින් ඩයිඇසිටයිල් මෝර්ෆින් ප්‍රතිශතය අඩුකර තිබුණි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මාදක රසායනාගාරය මාසිකව එකතු කරගත් වීථි හෙරොයින් නියැදියන් පරීක්ෂාවට ලක්කරන අතර පසුගිය වසර පහ තුළ පරීක්ෂාවට ලක්කළ නියැදියන්හි අගයන් විශ්ලේෂණය කරන විට හෙරොයින්වල සාමාන්‍ය ශුද්ධතාවයෙහි විශේෂ වෙනස්කම් දක්නට නොලැබෙන අතර එය සාමාන්‍යයෙන් වසර පහ පුරාම 38% - 40% අතර ශුද්ධතාවයකින් පැවතී ඇත.

## මත්ද්‍රව්‍ය භාවිත කරන ක්‍රම

ශ්‍රී ලංකාවේ හෙරොයින් භාවිත කරන්නන් බහුතරය චයිනීස් ක්‍රමය (Chase the dragon) ලෙස හැඳින්වෙන දුම බටයෙන් ඉරීමේ ක්‍රමයට හෙරොයින් භාවිත කරති. හෙරොයින් විඳගැනීම තුළින් භාවිත කරන සංඛ්‍යාව සීමාසහිත වේ. ගංජා සහ හෂීස්ද දුම ඉරීම සිදුකරයි. අබිං කෑමක් ලෙස භාවිත කරති. හෙරොයින් භාවිත කරන්නන්ගෙන් 99% ක්ම දුම්බීම පුරුද්දක් ලෙස සිදුකරන අතර සුළු පිරිසක් මත්පැන් ද භාවිත කරති.

## මාදක / මනෝවර්ධක ද්‍රව්‍ය දුර්භාවිතය

ශ්‍රී ලංකාව තුළ ප්‍රති-අවපීඩක, උත්තේජක, නිද්‍රාජනක වැනි ඖෂධ වර්ග දුර්භාවිතය ඉතා අඩු වශයෙන් පවතී. වෛද්‍යමය හේතුන් මත හෝ හෙරොයින් වෙළඳසලේ නොමැති විට කායික විරමන ලක්ෂණ මඟහරවා ගැනීම සඳහා හෙරොයින් භාවිත කරන්නන් මනෝචිකිත්සාවේ නිත්‍යානුකූලව භාවිත වන ඇම්ෆිටමින් (Amphetamine), ඩයසිෆෑම්(Diazepam), මෙතඩෝන්(Methadone) වැනි විවිධ පෙති වර්ග භාවිත කරති. මෙවැනි ද්‍රව්‍ය වෛද්‍ය වට්ටෝරුවකට අනුව පමණක් නිකුත් කළ යුතු වුවද ඖෂධ අලෙවිසැල්වලින් වෛද්‍ය වට්ටෝරු නොමැතිව නිකුත් කරන බැවින් නිත්‍යානුකූල නොවන ආකාරයෙන් භාවිත කරන්නන්ට ලබාගැනීමේ පහසුව ඇත. පසුගිය වසර 5 ක කාලය සළකා බැලීමේදී ඇම්ෆිටමින් (Amphetamine) පෙති සමඟ පුද්ගලයන් හතරදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණි.

## පූර්ව රසායන වර්ග

රසායනාගාර විද්‍යාගාර තුළ රසායනික ප්‍රතික්‍රියාවක් තුළින් සින්තටික් වර්ගයේ මත්ද්‍රව්‍ය හා නාකොටික් වර්ගයේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති රසායනික වර්ග ''පූර්ව රසායන'' (මූලික රසායන )නම් වේ. මෙවැනි රසායනික වර්ග 23 ක් නම්කර තිබෙන අතර මෙම රසායනික වර්ග කර්මාන්ත ක්ෂේත්‍රයේ විවිධ භාණ්ඩ නිෂ්පාදන සඳහා නිත්‍යානුකූලව යොදාගනු ලැබේ.

එහෙත් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට නිත්‍යානුකූල නොවන ආකාරයෙන් මෙම පූර්ව රසායන වර්ග භාවිත කරමින් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇත.

ශ්‍රී ලංකාව තුළ මෙම පූර්ව රසායන වර්ග කිසිවක් නිෂ්පාදනය නොකරන අතර කර්මාන්ත නිෂ්පාදන හෝ ඖෂධ නිෂ්පාදන සඳහා මෙවැනි ද්‍රව්‍ය ආනයනය කරනු ලැබේ. පසුගිය වසර පහක කාලය තුළ ඇසිටික් ඇන්හයිඩ්‍රයිට් (Acetic Anhydride), ඇසිටෝන් (Acetone), එපිහිඩ්‍රීන් (Ephedrine), අර්ගොමෙට්‍රින් (Ergometrine), හයිඩ්‍රොක්ලෝරික් ඇසිඩ් (Hydrochloric Acid), මෙතිල් ඊතයිල් (Methyl Ethyl), කෙටොන් (Ketone), පිපරනෝල් (Piperonal), පොටැසියම් පර්මැන්ගනේට් (Pottassium Permanganate), ස්යුඩොඑපිහිඩ්‍රීන් (Pseudoephedrine), සල්පියුරික් ඇසිඩ් (Sulphuric Acid), සහ ටොලියුන් (Toluene) ආනයනය කරනු ලබන අතර මේවා පූර්ව රසායන ලෙස යොදාගනිමින් හෙරොයින්, කොකේන්, මෙතකලොන් LSD/MDA/MDMA/ ඇම්පිටමින් (Amphetamine), මෙතම්පිටමයින් (Methamphatamine, පෙන්සයික්ලිඩින් (Phencyclidine) වැනි නාකොටික් වර්ගයේ මත්ද්‍රව්‍ය හා පෙතිවර්ග නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇත. ලංකාවේ පූර්ව රසායන උපයෝගි කරගනිමින් සින්තටික් වර්ගයේ මත්ද්‍රව්‍ය මෙතෙක් නිෂ්පාදනය කළ බවට වාර්තා නොමැත. එහෙත් 2008 වසරේදී අවිස්සාවේල්ල කොස්ගමදී රහසිගත රසායනාගාරයක් වැටලීමත් සමඟම මෙවැනි රසායනාගාර තුළින් සින්තටික් වර්ගයේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ අවදානමක් පවතින බවට හෙළිදරව් විය.

මෙවැනි ක්‍රියා වැළැක්වීමේ අරමුණින් “2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්ථක නීති විරෝධි ලෙස ජාවාරම්කිරීමට එරෙහි සම්මුති පනත” 2008 ජනවාරි මාසය තුළදී ශ්‍රී ලංකාව තුළ සම්මත කරගන්නා ලදි. මෙම පනත එක්සත් ජාතින්ගේ මාදක ඖෂධ සහ මනෝවර්ථක ද්‍රව්‍ය නිතිවිරෝධි ලෙස ජාවාරම් කිරීමේ පනතට සහ 1988 එක්සත්ජාතින්ගේ සම්මුතියට සහ සාර්ක් සම්මුතියට අනුබල දෙනු ලබයි. 2009 වර්ෂය සඳහා මෙවැනි වර්ගයේ නිෂ්පාදන හෝ පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම් වාර්තා වී නොමැත.

## මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සහ ප්‍රවාහනය

නිතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් කරනු ලබන මත්ද්‍රව්‍ය වැටලීම් නිත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය වෙළඳාමෙහි හා ප්‍රවාහනයෙහි ප්‍රවනතා තක්සේරු කිරීමට ඇති ප්‍රධාන සාධකයකි. ශ්‍රී ලංකාව ලෝක මත්ද්‍රව්‍ය ප්‍රවාහනයෙහි ප්‍රධාන සංධිස්ථානයක් වන අතර පාකිස්ථානයේ සිට යුරෝපයට සහ බටහිර රටවලට කොළඹ, මාලේ හරහා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා ප්‍රවාහකයින් කටයුතු කරනු ලබයි.

දුඹුරු හෙරොයින් ප්‍රධාන වශයෙන් ඉන්දියාවේ සහ පාකිස්ථානයේ සිට ශ්‍රී ලංකාවට නීති විරෝධී ලෙස ගෙන එනු ලබයි. පසුගිය වසර 5 ක කාලය තුළ විදේශිකයන් 43 දෙනෙකු ශ්‍රී ලංකාවේදී මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත්වී තිබුණි. මේ අතර පාකිස්තානුවන් 20 (50%) ක් හා ඉන්දියානුවන් 09 (21%) දෙනෙකු, මාලදිවයින් ජාතිකයන් 4 දෙනෙකු සහ බ්‍රිතාන්‍ය ජාතිකයින් දෙදෙනෙකු ඒ අතර වූහ. 2009 වසරේදී ශ්‍රී ලංකාව තුළදී විදේශිකයන් 12 දෙනෙකු

අත්අඩංගුවට ගෙන තිබූ අතර ඒ අතර පාකිස්ථානු, ඉන්දියානු හා නේපාල් ජාතිකයෝ වූහ. ඔවුන් සතුව තිබී හෙරොයින් කිලෝ 7 ක් සහ කොකේන් ග්‍රෑම් 448 ක්ද අත්අඩංගුවට ගෙන තිබුණි.

2009 වර්ෂයේදී පිරිමි පුද්ගලයින් 14 දෙනෙකු මත්ද්‍රව්‍ය වැරදි සඳහා විදේශයන්හිද අත්අඩංගුවට ගෙන තිබුණි. බහුතරයක් ශ්‍රී ලාංකිකයන් දකුණු කොරියාවේදී අත්අඩංගුවට පත්වී තිබුණ අතර ඉන්දියාව සහ අබුඩාබිහිදී අනෙකුත් පුද්ගලයන් අත්අඩංගුවට පත්වී තිබුණි. ඔවුන් සතුව ගංජා කිලෝ 2 ග්‍රෑම් 798 ක්ද හෙරොයින් කිලෝ 3 යි ග්‍රෑම් 451 ක්ද සහ ඇම්පිටමින් පෙති 8 ක් ද තිබී ඇත.

**ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවය**

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන විසින් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන සේවාවන් පවත්වාගෙන යනු ලබයි. ස්වේච්ඡාවෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගැනීමේ මෙතෙක් පැවති ක්‍රමය වෙනුවට 2007 දි අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි වූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිළිබඳ පනත මගින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අනිවාර්ය ප්‍රතිකාර ක්‍රමය ලංකාවට හඳුන්වා දෙන ලදි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සතුව නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන 4 ක් තිබෙන අතර කොළඹ, නුවර, ගාල්ල යන මධ්‍යස්ථාන නොමිලේ ප්‍රතිකාර සේවාවන් සපයනු ලැබේ. නිට්ටඹුව (ඌරාපොළ) මධ්‍යස්ථානය පමණක් පිරිවැය බෙදාගැනීමේ පදනම මත (Cost-Sharing Basis) ප්‍රතිකාර සේවය සපයනු ලැබේ. මෙම මධ්‍යස්ථානයේ මත්පැන් සඳහා විශේෂ ප්‍රතිකාර ක්‍රියාත්මක කරයි. මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල "මනෝචිකිත්සක ප්‍රතිකාර" මුල්කරගත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. ප්‍රතිකාර වැඩසටහනෙහි අන්තර්ගතය ගත්කල පුද්ගලයා සහ පවුල මුල්කරගත් උපදේශන ක්‍රියාවලියට අමතරව විෂහරණය, ශාරීරික ක්‍රියාකාරකම්, මානසික සුවතා, ගෘහස්ත හා බාහිර ක්‍රියාකාරකම්, කායවර්ධන, අධ්‍යාපන, සෞඛ්‍ය සහ ජීවන කුසලතා නංවාලීමේ වැඩසටහන් ඇතුළත් වී ඇත. මීට අමතරව රත්නපුර, කුරුණෑගල, නුවර, පුත්තලම, බදුල්ල, මාතලේ, අනුරාධපුර වැනි නගරවල බාහිරසේවා වැඩසටහන් සහ ප්‍රජා මූලික ප්‍රතිකාර කඳවුරු ක්‍රියාත්මක වේ.

මීට අමතරව බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සමඟ එකතුව මත්ද්‍රව්‍ය වැරදි සඳහා බන්ධනාගාර ගතවන පුද්ගලයන් වෙනුවෙන් තෝරාගත් බන්ධනාගාර කිහිපයක "බන්ධනාගාර ප්‍රතිකාරමය උපදේශන වැඩසටහන්" ක්‍රියාත්මක කරනු ලැබේ.

2009 වර්ෂය තුළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා පුද්ගලයන් 2975 දෙනෙකු ප්‍රතිකාර සඳහා යොමුවී තිබුණි. ඔවුන්ගෙන් 2387 දෙනෙක් (80%) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල ප්‍රතිකාර ලබා තිබුණු අතර 522 (18%) ක්

බන්ධනාගාර ප්‍රතිකාරමය වැඩසටහනට සහභාගී වී තිබුණි. 65 (2%) දෙනෙක් රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රතිකාර සේවය ලබා තිබුණි. ප්‍රතිකාර සඳහා පැමිණි අයගෙන් බහුතරය එනම් 60% ක් කොළඹ පදිංචිකරුවන් වෙති. ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 74% ක් අවුරුදු 30 හෝ ඊට වැඩි අයවූහ. ප්‍රතිකාර සඳහා පැමිණෙන සංඛ්‍යාවේ පහත බැසීමක් පසුගිය වසර පහ තුළ දක්නට ලැබේ. 2005 දී 3285 දෙනෙකු ප්‍රතිකාර ලබාගෙන තිබූ අතර එම සංඛ්‍යාව 2009 දී 2975 දක්වා 9% කින් පහත වැටී ඇත.

## බන්ධනාගාර ගතවීම්

2009 වසරේ සිරගතවූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව 37,872 ක් වන අතර ඔවුන් අතරින් 13,319 දෙනෙකු විෂ මත්ද්‍රව්‍ය වැරදි සඳහා නාකොටික් ගණයේ මත්ද්‍රව්‍ය සඳහා සිරගතවී තිබුණි. සිරගතවූ පුද්ගලයන්ගේ ව්‍යාප්තිය සළකා බලන විට නාකොටික් ගණයේ මත්ද්‍රව්‍ය සඳහා පමණක් ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 86 දෙනෙකු සිරගත වේ. අවුරුදු 14 ට වැඩි ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 79 දෙනෙකු සිරගත වේ. නාකොටික් ගණයේ මත්ද්‍රව්‍ය සඳහා සිරගතවූ පුද්ගලයන් සංඛ්‍යාව සලකනවිට ඔවුන් සුළු මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් ළඟ තබාගැනීමේ වරදට හසුවූ අයවූහ. 52.6% ක් හෙරොයින් වැරදි සඳහාද 47.3% ක් ගංජා වැරදි සඳහාද 0.1% ක් අබිං වැරදි සඳහාද සිරගතවී තිබුණි. මොවුන්ගෙන් බහුතරය සිංහල, බෞද්ධ අයවූ අතර ඉස්ලාම් ජාතිකයන් දෙවන ස්ථානයද හින්දු ජාතිකයන් තෙවන ස්ථානයන්ද හිමිකරගෙන තිබුණි.

## එච්.අයි.වී. /ඒඩ්ස්

මත්ද්‍රව්‍ය එන්නත් කරගැනීම තුළින් එච්.අයි.වී./ඒඩ්ස් ආසාදනය වීමේ අවදානමක් පවතී. එන්නත් කරගන්නා උපකරණ හුවමාරු කරගැනීම තුළින් ලේ හුවමාරුවීමෙන් පුද්ගලයෙකුට එච්.අයි.වි./ඒඩ්ස් වැළඳිය හැකිය. මත්ද්‍රව්‍ය එන්නත් කිරීම තුළින් එච්.එයි.වී. ආසාදනය වූ එක් පුද්ගලයෙක් පමණක් මෙතෙක් වාර්තාවී ඇත.

ලංකාවේ පළමුවරට එච්.එයි.වී. ආසාදිත පුද්ගලයකු වාර්තාවූයේ 1987 දීය. නිලවාර්තා වලට අනුව 2009 වසර වනවිට එච්.අයි.වී. ආසාදිත පුද්ගලයන් 1,196 ක් වාර්තා වී ඇති අතර මෙයට පිරිමි 707 ක් සහ ගැහැණු 489 ක් ඇතුලත්ය. මෙම වාර්තාගතවීම් වලින් පුද්ගලයන් 137 දෙනෙකු නව වාර්තාවීම් වේ. පසුගිය වසරේ වාර්තාවීම් අනුව බලනවිට 2009 වසරේදී වාර්තා වූ ගැහැණු සංඛ්‍යාව 9% කින්ද පිරිමි සංඛ්‍යාව 13% කින් ද වැඩිවී ඇත. 2009 වනවිට ඒඩ්ස් වැළඳුන පුද්ගලයින්ගේ සංඛ්‍යාව 309 දෙනෙකි. ඒ අතර පිරිමි 210 ක් හා ගැහැණු 99 දෙනෙක් වූහ. 2009 වනවිට ඒඩ්ස් වැළඳී මියගිය මුළු සංඛ්‍යාව 208 වන අතර 2009 වර්ෂය තුළදී පමණක් 16 දෙනෙකු මියගොස් තිබුණි.

## නීති ක්‍රියාත්මකවීම

ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාරය, ශ්‍රී ලංකා රේගුව, නාවික හමුදාව වැනි නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් 2009 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය වැරදි සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමෙහි නිරත වී තිබුණි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුව මගින් නීති සම්බන්ධීකරණ කටයුතු කරන අතර නව නීති සැකසීම ප්‍රතිපත්ති සැලසුම් කිරීම දිවයින පුරා නීතිය බලගැන්වීමෙහි නිරතවී සිටී. මීට අමතරව මණ්ඩලය බන්ධනාගාර සමඟ එක්ව ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

* * * * *